**කැස්බෑව නගර සභාව**
**කොළඹ දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1.මූල්‍ය ප්‍රකාශන
**------------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජුනි 27 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුලි 15 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**--------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කැස්බෑව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**----------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**-------------------**

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අගෝස්තු මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා ව්‍යාපෘති සේවකයන්ට අදාලව රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල වෙත ගෙවිය යුතු රු.523,458 ක මුදල වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසයට අදාලව ව්‍යාපෘති සේවකයින් වෙනුවෙන් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල වෙත ගෙවිය යුතු රු. 110,526 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය වෙනුවෙන් වෙන්කරනු ලැබූ රු.1,500,000 ක් වූ විගණන ගාස්තු වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඈ) ආසියානු සංවර්ධන බැංකු ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී වැඩිපුර හර වී තිබූ රු.23,961 ක් වූ පොලී මුදල අදාල වියදමින් අඩු නොකර සමුච්චිත අරමුදලට ගලපා තිබුණි.

#### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්
**------------------------**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 06 කට අදාල ශේෂයන් ඒවා තහවුරු කරන උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසැඳීමේදී මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වීම් රු.12,048,395 ක් ද, වැඩියෙන් දැක්වීම් රු. 793,719 ක් ද විය.

### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2015 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.17,124,670 ක් වූ සේවක ණයවලින් දීර්ඝ කාලයක් තිස්සේ අයනොවී පවතින ශේෂ එකතුව රු.244,316 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ දී ද කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයේ දී පැවති රු.42,164,795 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පත් ශේෂය තුළ වසර 05 ක කාලයක් ඉක්මවා තිබුණු ශේෂවල එකතුව රු.8,078,383 ක් වූ අතර ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 571 විධිවිධාන ප්‍රකාරව එම ඉකුත් තැන්පතු නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂය සඳහා ගෙවිය යුතු එකතුව රු.1,296,461 ක විගණන ගාස්තු 2016 ජුලි 31 වන විටත් විගණකාධිපති වෙත නිරවුල් කර නොතිබුණි.

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.103,195,690 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.57,235,862 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව සභාපතිවරයා විසින් ඉදිරිපත් කර තිබුණු තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ සාරාංශගත තොරතුරු පහත දැක්වේ.

| | 2015 | | | | 2014 | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂය | තථ්‍ය අයකරගත යුතු | තථ්‍ය අයකරගත් | වර්ෂයට හිඟය | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | තථ්‍ය අයකරගත යුතු | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | '000 | '000 | '000 | '000 | '000 | '000 |
| වරිපනම් හා බදු | 41,207 | 36,600 | 4,607 | 27,175 | 38,002 | 22,392 |
| බදු කුලී | 12,610 | 11,701 | 909 | 2,937 | 11,855 | 2,428 |
| බලපත්‍ර ගාස්තු | 6,150 | 5,444 | 706 | 1,150 | 5,235 | 420 |
| වෙනත් ආදායම් | 218,303 | 38,303 | 180,000 | 275,212 | 178,354 | 127,993 |
| | 278,270 | 92,048 | 186,222 | 306,474 | 233,446 | 153,233 |

**2.2.2** **වරිපනම් බදු**

**------------**

නගර සභා ආඥා පනතේ 170 වන වගන්තිය ප්‍රකාරව වරිපනම් බදු අයකර ගැනීම සඳහා කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූලා ප්‍රකාශන අනුව මුළු හිඟය රු.26,749,745 ක් වූ අතර මෙම ශේෂය තුළ රු.50,000 කට වැඩි ස්ථාන 05 කට අදාල එකතුව රු.1,099,094 ක ශේෂයක් 2016 ජුනි 30 දින වන විටත් අයනොවී පැවතුණි.

**2.2.3** **බදු කුලී**

**--------**

සභාවට අයත් කුලියට දී තිබුණු කඩ කාමර 355 න් කඩ කාමර 143 ක් සඳහා 2015 දෙසැම්බර් 31 දිනට රු.2,176,712 ක මුදලක් හිඟව පැවතුණි.

**03.** **මෙහෙයුම් සමාලෝචනය**

**-------------------------**

**3.1** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

**------------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ආදායම් උපයමින් තිබූ සභාව සතු පැරණි තානායම කඩා ඉවත්කර ඒ සඳහා රු.52,929,240 ක ඇස්තමේන්තුවක් යටතේ නව ගොඩනැගිල්ලක පළමු අදියර ඉදිකර 2014 දෙසැම්බර් 04 දින ව්‍යාපෘතිය නිමකර සභාවට භාරදී තිබුණි. 2016 මැයි 31 දින වන තෙක්ම මෙම ගොඩනැගිල්ල ආදායම් උපයන කිසිදු ඵලදායී කටයුත්තකට යොදා නොගැනීම නිසා සභාවට ලැබිය යුතු ආදායම් අහිමි වී තිබුණි. 2014 වර්ෂයේ අවසන් ගිණුම් විගණනයේ දී ද මෙම තානායම ඉදිකිරීමේ අඩුලුහුඩුකම් පිළිබඳව විගණනය විසින් පෙන්වා දී තිබුණ ද විගණිත දිනය වූ 2016 මැයි 31 දින වන විටත් මෙම ගොඩනැගිල්ල සභාවට ඵලදායී ආදායමක් ලැබෙන ලෙස යොදා ගැනීම සඳහා සභාව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ආ) සභාව විසින් නාගරික සංවර්ධන අධිකාරිය සමඟ පවත්වාගෙන යනු ලබන තානායම් නවීකරණය සඳහා වූ ජංගම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට රු.14,539,268 ක ශේෂයක් පැවති අතර මෙම මුදල ඉතුරුම් හෝ ස්ථාවර තැන්පත් ගිණුමක පවත්වාගෙන යැමට කටයුතු නොකිරීම නිසා සභාවට වාර්ෂිකව ලබා ගත හැකිව තිබුණු පොලී ආදායම අහිමි වී තිබුණි.

**3.2** **මෙහෙයුම් ආකාර්යක්ෂමතා**

**----------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයට පෙර ලබාදුන් රු.353,026 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු වරිපනම් බදු ආදායම් කළමණාකරණය කර ගැනීම සඳහා 2007 වර්ෂයේ දී පෞද්ගලික ආයතනයකින් මිල දී ගෙන ස්ථාපිත කර තිබූ පරිගණක මෘදුකාංග පද්ධතිය තුළින් වරිපනම් අංශයේ කිසිදු යාවත්කාලීන කරන ලද තොරතුරක් ඒකාබද්ධ කර හෝ සාරාංශගතව

ලබා ගත හැකි නොවූ අතර පද්ධතියේ පවත්නා අඩුපාඩු රාශියක් නිවැරදි කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. පරිගණකගත කරනු ලබන තොරතුරු සම්බන්ධයෙන් සභාවේ නිසි අධීක්ෂණයක් සිදු නොවීම හා දත්තවල ආරක්ෂාව සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) 2014 පෙබරවාරි 09 දිනැති අංක LGB/7/7/1/D1–2013 දරණ පළාත් පාලන කොමසාරිස්ගේ (බ.ප.) චක්‍රලේඛය වයස අවුරුදු 60 ට වැඩි සේවකයන් සේවයේ යොදවා නොගන්නා ලෙස දන්වා තිබුණ ද අවුරුදු 60 වැඩි සේවකයින් 4 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගෙන අවුරුදු 60 ට වැඩි වූ දින සිට 2016 ජූලි 31 දක්වා රු.2,164,721 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

**3.3 මාර්ග කැණීම් යථා තත්ත්වයට පත් නොකරීම**

**-------------------------------------------**

කැස්බෑව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුළ කළු ගඟ ජල සම්පාදන ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ ජල නල එලීම් සඳහා සිදු කර තිබූ මාර්ග කැණීම් යථා තත්වයට පත් කිරීමේ කටයුතු සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සභාව වෙත ලබාදුන් රු.24,020,350 ක් 2011 සහ 2013 වර්ෂවල සිට පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණු අතර 2015 දෙසැම්බර් 31 වන විටත් ඉන් ප්‍රයෝජනයට ගෙන තිබුණේ රු.7,018,885 ක් පමණි.මෙම ව්‍යාපෘතිය යටතේ අලාභ හානි වී තිබූ මාර්ග 19 ක් යථා තත්ත්වයට පත් කළ යුතුව තිබුණි.විගණනය විසින් එකී මාර්ග සම්බන්ධයෙන් 2015 සැප්තැම්බර් 21 දින සිදුකරනු ලැබූ භෞතික පරීක්ෂාවේ දී පහත කරුණු අනාවරණය විය.

i. මේ යටතේ වූ මාර්ග බොහොමයක් මග නැගුම ව්‍යාපෘතිය යටතේ තාර දමා තිබුණු අතර අනෙකුත් මාර්ගවල කඩතොලු වැසීම පමණක් සිදුකර තිබුණි.

ii. ඇතැම් මාර්ග කිසිදු ප්‍රතිසංස්කරණයකට ලක්වී නොතිබුණු බැවින් බෙහෙවින් අබලන් තත්ත්වයට පත් වී තිබුණි.

iii. ඇතැම් මාර්ගවල කොටසක් පමණක් ප්‍රතිසංස්කරණය කර තිබූ අතර ඉතිරි කොටස් අබලන්ව පැවතුණි.

iv. මාර්ග දෙපස වූ නිවාස සඳහා ජල සැපයුම් ලබා ගැනීමට කඩා දමා තිබූ මාර්ග පිළිසකර කර නොතිබුණි.

මේ අනුව මෙම මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණු මුදල් අදාල කාර්යය සඳහා ඵලදායී ලෙස භාවිතා කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**--------------------------**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**------------------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු වටිනාකම රු.385,300 ක් වූ වාහන 05 ක් වර්ෂ 02 සිට වර්ෂ 05 දක්වා වූ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් මගින් 2012 පෙබරවාරි මස ලැබුණු කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් හා 2013 නොවැම්බර් 13 දින සභාව මිල දී ගන්නා ලද රු.140,000 ක් වූ ඔරු අඟුල කිසිදු ප්‍රයෝජනයක් නොගෙන කැස්බෑව උපකාර්යාලයේ ගාල්කර තිබුණි.

## 3.5 හඳුනාගත් අලාභ

-------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි අංක 128 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව නගර සභාව විසින් නිසි මූල්‍ය පරිපාලනයක් පවත්වා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී බැංකු අයිරා පොලී සඳහා රු. 487,204 ක් ගෙවා තිබුණි.

(ආ) පිළියන්දල මහජන පුස්තකාලයෙන් බාහිර පාඨකයන් විසින් 2008 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාල සීමාව තුළ බැහැර ගෙන ගොස් ආපසු බාර නුදුන් පොත් 300 ක් ආපසු ලබාගැනීමට හෝ ඒවායේ වටිනාකම වූ රු.61,880 ක් අදාල වගකිවයුත්තන්ගෙන් අයකර ගැනීමට 2016 ජුනි 30 දින වන විටත් සභාව කටයුතු කර නොතිබුණි.

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනය

------------------------

සමාලෝචිත වර්ෂයේ සභා බලප්‍රදේශය තුළ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති 213 ක් සඳහා ගිවිසුම් ගත වී ඇති අතර එයින් 42 ක් නිමකර නොතිබුණි. ගිවිසුම්ගත වී ඇති 213 න් සභා අරමුදලින් කිරීමට ගිවිසුම්ගත වී ඇති ව්‍යාපෘති ගණන 41 ක් වූ අතර ඉන් එක් ව්‍යාපෘතියක් අවලංගු කර තිබුණි.

# 04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------

## 4.1 අයවැය පාලනය

-----------------

වර්ෂය තුළදී ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය, ආදායම් හා වියදම්වල සියයට 01 සිට සියයට 236 ක් දක්වා විචලනයන් පැවතුණු අවස්ථා 17 ක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.133 (1) සහ (2) හි දැක්වෙන විධිවිධාන පරිදි අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු සංවිධානය කරගෙන නොතිබුණි.

## 4.3 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්

--------------------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා නිකුත් කරන ලද විගණන විමසුම් 05 කට 2016 ජුනි 10 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගණුදෙනුවල වටිනාකම රු.5,811,019 ක් විය.ඉකුත් වර්ෂය වෙනුවෙන් නිකුත් කරන ලද විගණන විමසුම් දෙකකට ද ඉහත දිනය වන විටත් පිළිතුරු සපයා නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

-----------------

පහත සඳහන් පද්ධති හා පාලන  ක්ෂේත්‍ර කෙරෙහිද විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණනය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ගිණුම්කරණය
(ඉ) ආදායම් පරිපාලනය
(ඊ) වත්කම් කළමනාකරණය
(උ) ණයගැති ණයහිමි පාලනය